**විසර්ජන ශීර්ෂය - 174 පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2011 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

I කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව
II කොටස - එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

**පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව |
| 326 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව |

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක් සදහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.4,375,372,720 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.4,243,991,301 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.7,839,034 ත් රු.86,383,935 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.32 ත් සියයට 11.37 ත් අතර පරාසයක ප්‍රතිශතයකින් පැවතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 174 | පුනරුතථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 182,432,720 | 404,465,000 | 166,296,188 | 383,443,082 | 16,136,532 | 21,021,918 |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 3,383,620,000 | 335,950,000 | 3,362,171,827 | 271,014,238 | 21,448,173 | 64,935,762 |
| 326 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 63,025,000 | 5,880,000 | 60,477,773 | 588,193 | 2,547,227 | 5,291,807 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| එකතුව | 3,629,077,720 | 746,295,000 | 3,588,945,788 | 655,045,513 | 40,131,932 | 91,249,487 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 17401 | 2,355,000 | 2,253,294 | 1,000,000 | 2,067,802 | 12,000,000 | 6,785,178 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23201 | 125,600,000 | 124,007,897 | 95,000,000 | 119,255,567 | 422,000,000 | 329,268,234 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 32601 | 2,355,000 | 2,353,188 | 2,000,000 | 3,631,103 | 17,000,000 | 13,833,061 |

### 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් විසින් වාණජ අත්තිකාරම් ගිණුමක් පවත්වා ගෙන ගොස් තිබුණි.

(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.

බන්ධනාගාර කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද නොතිබුණි.

| දෙපාර්තමේන්තුව | විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23202 | 120,000,000 | 104,653,689 | 135,000,000 | 98,542,963 | 30,000,000 | 65,592,414 |

(ආ) <u>මූල්‍ය ප්‍රතිඵල</u>

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය පතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2011 | | 2010 | |
| | | ලාභය (කල්පිත ගාස්තු රහිතව) | ලාභය (කල්පිත ගාස්තු සහිතව) | ලාභය (කල්පිත ගාස්තු රහිතව) | ලාභය (කල්පිත ගාස්තු සහිතව) |
| | | රු. | රු. | රු. | රු. |
| 23202 | බන්ධනාගාර කෘෂිකාර්මික හා කාර්මික කටයුතු | 39,427,871 | 1,873,986 | 39,666,949 | 15,687,296 |

## 2.3 <u>අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්.</u>

### 2.3.1 <u>අග්‍රිම ගිණුම්</u>

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2011 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල එකතුව රු.9,664,519 ක් වූ හර ශේෂ තිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 6,660,318 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 3,004,201 |
| එකතුව | 9,664,519 |

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

2011 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේනතු දෙකක පොදු තැන්පත් ගිණුම් වල ශේෂවල එකතුව රු.48,035,269 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 32,044 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 221,109 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 47,782,116 |
| | 48,035,269 |

## 11 කොටස

## එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශිර්ෂය 174 - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

#### 1.1. විගණන විෂය පථය.

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්පන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 නොවැම්බර් 22 දින පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය ,අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

#### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

විසර්පන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ විගණන නිරීක්ෂණය</u>

2011 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>අයවැය විචලනය</u>

වැය විෂය දෙකක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.360,000 ක් වූ සම්පූර්ණ පුනරාවර්තන ප්‍රතිපාදනයද, වැය විෂයන් 03 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.1,050,000 ක් වූ මුලධන ප්‍රතිපාදනයද ඉතිරිවී තිබුණි.

(ආ) <u>සංයුක්ත සැලැස්ම.</u>

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්‍ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශ විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 ඔක්තෝබර් 10 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඇ)<u>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.</u>

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2011 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2011 ජුනි 07 දින දීය.

1.4. <u>වත්කම් කළමනාකරණය.</u>

(අ) <u>වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණ පැවැත්වීම.</u>

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්‍ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්‍ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණය 2012 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්‍ෂණය 2012 අප්‍රේල් 30 දින වන විටත් පවත්වා නොතිබුණි. අවසාන වරට භාණ්ඩ සමීක්‍ෂණය පවත්වා තිබුණේ 2010 වර්ෂය වෙනුවෙනි.

1.5 <u>කාර්ය සාධනය.</u>

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අවස්ථාවන් නිරීක්ෂණය විය.

(අ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ප්‍රතිසංස්කරණය කිරීම.

(ආ) ප්‍රතිසංස්කරණ කටයුතු විධිමත් කිරීම සඳහා බන්ධනාගාර ආඥාපනත සංශෝධනය කිරීම.

(ඇ) සුළු අපරාධවලට දඬුවම් ලබන්නන් බන්ධනාගාර ගත කිරීම වෙනුවට විශෝධන ක්‍රියාවලියට යොමු කිරීමට ප්‍රජා විශෝධන ආඥාපනත සංශෝධනය කිරීම.

(ඈ) පුනරුත්ථාපන කටයුතු කාලීන අවශ්‍යතා අනුව පුළුල් කිරීමට 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරි පනත සංශෝධනය කිරීම.

මේ සම්බන්ධයෙන් බන්ධනාගාර ආඥාපනත හා ප්‍රජා විශෝධන පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2013 ජනවාරි මස මාවෙත වාර්තාකර තිබුණි.

## 1.6 පාඩු හා හානි.

2011 වර්ෂය තුළ අවස්ථා 3 කදී සිදුවූ වාහන අනතුරු හෙළිදරව් කිරීමකින් තොරව අමාත්‍යාංශයේ ජීප් රථයක සීරීම් ඇති බව සඳහන් කර රු.88,000 ක් වැයකර සම්පූර්ණ තීන්ත ආලේප කර තිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය.

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 10 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 | - |
| (iii) | ද්විතියක මට්ටම | 20 | 24 | - | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 17 | 02 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 06 | 09 | - | 03 |
| | එකතුව | 58 | 61 | 04 | 07 |

බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2 විසර්ජන ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව.

### 2.1 විගණන විෂය පථය.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 දෙසැම්බර් 21 දින බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම්

ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ විගණන නිරීක්ෂණය

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා වූ ඡේදවල සඳහන් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛණ හා පොත්පත් පවත්වා නොගැනීම.

දෙපාර්තමේන්තුව විසින් මු.රෙ 502(2) විධිවිධාන ප්‍රකාර පවත්වාගත යුතු ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබූ අතර මු.රෙ.110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛණය නියමිත ආකෘතියේ පවත්වා නොතිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම

2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.47,782,116 ක් වූ අතර එහි අන්තර්ගත පහත සඳහන් රු.32,965,757 ක ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

| | |
|---|---|
| තැන්පත් ගිණුම - ඇප | - රු. 1,047,088 |
| තැන්පත් ගිණුම - ටෙණ්ඩර් | - රු. 4,151,520 |
| විවිධ තැන්පත් | - රු.27,767,149 |

(ඇ) <u>අත්තිකාරම් ගිණුම්.</u>

(i) <u>විෂය අංක 23201 දරන රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම.</u>

2011 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.12,161,154 ක්වූ අතර, එම හිඟ ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

මියයාම හා සේවය අතහැරයාම නිසා වසරකට වැඩි කාලයක් රු.2,353,594 ක හිඟ ණය හා අත්තිකාරම් ශේෂ පැවති අතර එම මුදල් අයකර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

ලබාගත් උත්සව අත්තිකාරම් වල වාරික ගෙවා අවසන් වීමට පෙර නැවත උත්සව අත්තිකාරම් ගෙවා තිබූ අවස්ථාවන් නිරීක්ෂණය විය.

(II) <u>බන්ධනාගාර කෘෂිකාර්මික හා කාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම.</u>

- පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද නොතිබුණි.

| සීමාව | අනුමත | තථ්‍ය | ඉක්මවීම / (ඌනතාවය) |
|---|---|---|---|
| වියදම | 120,000,000 | 104,653,689 | 15,346,311 |
| ලැබීම් | 135,000,000 | 98,542,963 | (36,457,037) |
| හර ශේෂය | 30,000,000 | 65,592,414 | 35,592,414 |

- විෂය අංක 23202 දරන බන්ධනාගාර කෘෂිකාර්මික හා කාර්මික කටයුතු අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.75,225,119 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

2.4 <u>වත්කම් කළමනාකරණය.</u>

(අ) <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2011 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2012 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්

කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2012 මාර්තු 31 දින වන විටත් පවත්වා නොතිබුණි. අවසාන වරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2010 වර්ෂය වෙනුවෙනි.

(ii) පසුගිය වර්ෂවල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) <u>බේරුම් නොකළ බැරකම්</u>**

දෙපාර්තමේන්තුව විසින් 2011 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.528,043,610 ක් වූ අතර, ඒ පළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

2.5 <u>අනුකූල නොවීම්.</u>

<u>නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) මුදල් රෙගුලාසි 2(1) | 397,750 | මහර බන්ධනාගාර ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් 2011 වර්ෂයේදී රු.397,750 ආදායමක් ලැබී තිබූ අතර, එය රාජ්‍ය ආදායමට බැර නොකර ක්‍රීඩා හා සුභ සාධක සංගමයට ලබාදී ඇති බව නිරීක්ෂණය විය. |
| (ii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිත්‍ය නියෝග අංක 463 | | දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග ප්‍රකාරව සිරකරුවෙකු නිදහස්වීමේදී සිරකරු වැටුප් ඇතුලු මුදල් ගෙවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොමැති අවස්ථාවන් නිරීක්ෂණය විය. |
| (iii) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙ. | | |
| • 3 ජේදය. | 2,771,839 | රාජ්‍ය අරමුදල්වල මෙහෙයුම් සහ කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන තැගි අරමුදලට වැඩසහන පදනම මත සේවය කරන සිරකරුවන්ගේ වැටුපෙන් සියයට 10 ක් බැගින් ලබාගෙන අරමුදල් රැස්කර තිබුණි. |

- 4.2 ජේදය. 1,200,000 අවස්ථා දෙකකදී විධිමත් අනුමැතියකින් තොරව තැගි අරමුදල නමින් ලංකා බැංකුවේ රු.500,000 හා රු.700,000 ක් වශයෙන් ස්ථිර තැන්පත් ගිණුම් දෙකක් ආරම්භ කර තිබුණි.

2.6 <u>අවිධිමත් ගනුදෙනු.</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ කර්මාන්ත සඳහා අවශ්‍ය වූ භාණ්ඩ වර්ග 10 ක් මිලදී ගැනීම සඳහා 2011 ජුලි මාසයේදී රු.466,720 ක් ගෙවා තිබුණත්, 2011 දෙසැම්බර් මාසය වන විටත් එම භාණ්ඩ ලබාගෙන නොතිබුණි.

(ආ) අනතුරට පත්ව තිබූ මහර බන්ධනාගාරයේ බස් රථයක අළුත්වැඩියාව සඳහා කඩවත ලංගම ඩිපෝවේ ඉංජිනේරුවරයා විසින් රු.81,724 ක ඇස්තමේන්තුවක් ලබාදී තබුණත් වාහන අළුත්වැඩියාව දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ වෙනත් ගරාජයකින් රු.187,360 ක් ගෙවා සිදුකර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුවට වඩා රු.105,636 ක් වැය කර තිබණු අතර, බසයේ ඉතිරි කොටස අළුත්වැඩියා කර තීන්ත ආලේප කිරම සඳහා අතිරේකව රු.423,650 ක් වැයකර තිබණි.

2.7. <u>වංචනික ස්වරූපයේ ගනුදෙනු.</u>

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවශ්‍ය දුඹුරු පැහැති කැන්වස් පාවහන් යුගල 2,782 ක් සපයා ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි. ලැබී තිබුණු මිල ගණන් වලින් පාවහන් නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, නියෝජිතයෙකු නොවන ආයතනයක් සැපයුම්කරුවෙකු ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව විසින් පිරිවිතරයන් ඇගයීමේදී වෙළඳපලේ පවතින පාවහන්වල මිල, ඒවායේ ප්‍රමාණය (Size) අනුව මිල ගණන් වෙනස්වීම යන කරුණු කෙරෙහිද, පාවහන් පතුලෙහි සඳහන් නිෂ්පාදන නාමයත්, මිල ගණන සඳහන් වීමත්, පාවහන් වල ප්‍රමාණය අනුව මිල ගණන් වෙනස් වීමත් යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් තොරව අදාල සැපයුම්කරු තෝරා ගැනීමට නිර්දේශකර තිබුණි. බන්ධනාගාර මූලස්ථාන ගබඩාවට සපයා තිබූ පාවහන් පෙට්ටි භෞතික පරීක්ෂාවේදී පාවහන් නිෂ්පාදනය, සැපයීම සහ විකිණීම සිදුකරන දේශීය සමාගමක නම සහිත පෙට්ටිවල එම පාවහන් අසුරා තිබූ අතර, කැන්වස් පාවහන් යුගල බැගින් අසුරා තිබූ පෙට්ටිවල එකී සමාගමේ වෙළඳ නාමය ද සටහන්ව තිබුණි. දෙපාර්තමේන්තුවට පාවහන් සැපයීම සඳහා තෝරාගත් සැපයුම්කරු එකී සමාගමේ නියෝජිතයෙකු නොවන බවද විගණනයේදී වැඩිදුරටත් අනාවරණය විය.
පාවහන් යුගල බැගින් ඇසුරුම් කර සපයා තිබූ පෙට්ටිවල මිල ගණන් මකා දමා තිබූ අතර, සඳහන් කර තිබූ මිල ගණන් අනුව ප්‍රමාණය 5 සිට 9 දක්වා පාවහන් යුගලයක මිල රු.980 ක්ද, ප්‍රමාණය 10 සිට 13 දක්වා යුගලයක මිල රු.1,070 ක්ද විය. මේ අනුව දෙපාර්තමේන්තුවට මිලදීගෙන තිබුණු රු.980 ක් බැගින් සඳහන් වූ පාවහන් යුගල 2,216 ක් සඳහා රු.2,171,458 ක්ද රු.1,070 බැගින් සඳහන් වූ යුගල 566 ක් සඳහා රු.605,563 ක්ද වශයෙන් ගෙවිය යුතු මුළු මුදල රු.2,777,022 ක් වී තබුණි. නමුත් දෙපාර්තමේන්තුවට සපයා තිබූ පාවහන් යුගල 2,782 සඳහාම එකක් රු.1,528 බැගින් රු.4,250,896 ක් 2011 ජූනි 06 දින ගෙවා තිබූ හෙයින් රු.1,473,874 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

## 2.8. පාඩු හා හානි.

(අ) 2011 වර්ෂයට අදාලව සිදුව තිබූ රු.1,526,101 ක අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 හා 104 විධිවිධාන ප්‍රකාරව පරීක්ෂණ පවත්වා ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) මීගමුව බන්ධනාගාරයේ 2010 දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම ප්‍රමාද වීම හේතුවෙන් ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ප්‍රමාද ගාස්තු වශයෙන් රු.15,460 ක ගෙවා තිබුණි.

## 2.9. කළමනාකරණ අකාර්යක්ෂමතා.

මහර බන්ධනාගාරයේ දෛනිකව බැහැර කරන අපද්‍රව්‍ය විධිමත් අයුරින් බැහැර නොකිරීම හේතුවෙන් පැන නැගී ඇති ගැටළුවට ස්ථිර විසඳුමක් ලෙස දිරායන කුණු කසල භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිපදවීමේ අංගනයක් ඉදිකිරීමේ හා පවත්වාගෙන යාමේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් මහර ප්‍රාදේශීය සභාව සමග ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.10. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

බැංකු සැසඳුම් ප්‍රකාශවල පෙන්වා තිබුණු මාස 06 කට වැඩි කාලයක් තිස්සේ පැවති රු.90,107 ක් වූ හඳුනා නොගත් ලැබීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.11. මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

2011 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 41 | 15 | - |
| (ii) | තෘතියික මට්ටම | 5651 | 4770 | 881 | - |
| (iii) | ද්විතියක මට්ටම | 402 | 258 | 144 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 252 | 224 | 28 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 12 | - | 12 |
| | එකතුව | 6361 | 5305 | 1068 | 12 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1068 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. <u>විසර්ජන ශීර්ෂය 326 - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව.</u>

3.1 <u>විගණන විෂය පථය.</u>

ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 නොවැම්බර් 21 දින ප්‍රජා විශෝධන කොමසාරිස් ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

3.2 <u>**ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.**</u>

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිළධාරී හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

3.3 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ විගණන නිරීක්ෂණය</u>

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>අයවැය විචලනය.</u>

මුලධන වැය විෂයක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.5,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්‍ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඇ) රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.

විෂය අංක 32601 දරන රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.511,297 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

3.4 වත්කම් කළමනාකරණය.

වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණ පැවැත්වීම.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්‍ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්‍ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණය 2012 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 ජුනි 18 දින දීය.

3.5 මානව සම්පත් කළමනාකරණය.

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා.

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 01 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 113 | 93 | 20 | - |
| (iii) | ද්විතියක මට්ටම | 131 | 61 | 70 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 04 | 07 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් | - | 22 | - | 22 |

| | | | | |
|---|---|---|---|---|
| පදනම) | | | | |
| එකතුව | 259 | 181 | 100 | 22 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 98 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 3.6 අභ්‍යන්තර පාලනය.

**විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.**

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.